# ව්‍යවසායකත්ව අධ්‍යයනය

7

## විෂයානුබද්ධ පුනරීක්ෂණ සංචිතය

## 11 ශ්‍රේණිය

## ව්‍යවසායකත්ව සංස්කෘතිය

(1) ව්‍යවසායකයන් ට ආවේණික වූ විශේෂිත ගති පැවතුම්, ආකල්ප, විශ්වාස, අදහස්, හැසිරීම් රටා,චාරිත්‍ර වාරිත්‍ර ,සම්මත, යනාදී අංගවල එකතුවක් ලෙස හැඳින්වෙන්නේ,

1. ව්‍යවසායකත්ව ගති ලක්ෂණ වේ.
2. ව්‍යාපාර ආචාරධර්ම වේ.
3. ව්‍යවසායකත්ව සංස්කෘතිය වේ.
4. ව්‍යාපාර පරිසරය වේ.

(2) ව්‍යවසායකත්ව සංස්කෘතියක් නිර්මාණය වීම සඳහා බලපාන සාධකයක් නොවන්නේ,

1. සාර්ථක ව්‍යවසායකයන්ගේ ආදර්ශ චරිත සමාජයේ වැඩි වශයෙන් දක්නට ලැබීම.
2. සම්පත් සුලභ ව පැවතීම.
3. රාජ්‍ය හා වෙනත් ආයතන වල දිරිගැන්වීම්.
4. අහිතකර ආර්ථික පරිසරයක් පැවතීම.

(3) ව්‍යවසායකයෙකු වීමට කාන්තාවන් තුළ ඇති ශක්තියක් නොවන්නේ,

1. පිරිමැසුම් සහගත බව
2. නිර්මාණශීලීත්වය ඉහළ මට්ටමක පැවතීම
3. ප්‍රාග්ධනය සපයා ගැනීමේ දුෂ්කරතාවය
4. කාලය නිසි පරිදි ප්‍රයෝජනයට ගැනීම

(4) ව්‍යාපාරයක ආචාරධර්ම පද්ධතිය පදනම් වන්නේ එම ව්‍යාපාරයට සම්බන්ධ පුද්ගලයන්ගේ,

1. මූල්‍ය හැකියාව මතය.
2. අගනාවන් මත ය .
3. කීර්තිනාමය මතය.
4. දක්ෂතාවය මත ය.

(5) ව්‍යාපාර සමාජ වගකීම ඉටු කිරීමේදී එසේ වගකීම ඉටු කළ යුතු පාර්ශවයක් නොවන්නේ,

1. අයිතිකරුවන්
2. ගනුදෙනුකරුවන්
3. ව්‍යාපාරය
4. ප්‍රජාව

(6) සේවකයින් ව්‍යාපාරය කෙරෙහි උනන්දුවක් දැක්වීමෙන් අපේක්ෂා කරන්නේ,

1. සාධාරණ මිලකට ගුණාත්මක භාණ්ඩ ලබා ගැනීමටය.
2. යෙදවූ ප්‍රාග්ධනය ට ප්‍රමාණවත් ප්‍රතිලාභයක් ලබා ගැනීමටය.
3. සාධාරණ වැටුපක් ලැබීම හා රැකියාවේ සුරක්ෂිතතාවයට ය.
4. ණය නියමිත කාල සීමාවේදී අය කර ගැනීමටය.

(7) ව්‍යවසායකයන් දිරිගැන්වීම සඳහා රජය විසින් ලබා දෙන මූල්‍ය දිරිගැන්වීමක් නොවන්නේ මින් කවරෙක්ද?

1. වාණිජ බැංකු ණය පහසුකම්
2. අනෙකුත් බැංකු ණය පහසුකම්
3. වෙළෙඳපල පහසුකම්
4. ත්‍යාග සහ මූල්‍යාධාර

(8) පහත ප්‍රකාශ අතුරින් ව්‍යවසායකත්ව සංස්කෘතිය වඩාත් හොඳින් විස්තර කෙරෙන ප්‍රකාශය වන්නේ කුමක්ද?

1. සමාජය තුළ ව්‍යවසායකයින් පිළිබඳව ගොඩනැගී ඇති විවිධ මත වාද ව්‍යවසායකත්ව සංස්කෘතිය වේ.
2. ව්‍යවසායකයින්ට ආවේණික වූ විවිධ ගති පැවතුම් ආකල්ප විශ්වාස අදහස් හැසිරීම් රටා ව්‍යවසායකත්ව සංස්කෘතිය වේ.
3. පරිසරයේ වෙනස්වීම් වලට ප්‍රතිචාර දක්වමින් ව්‍යාපාර අවස්ථා උදාකර ගැනීම ව්‍යවසායකත්ව සංස්කෘතිය වේ .
4. ගැටලුවකට විසඳුම් වශයෙන් සමාජයට වැඩදායී ලෙස නවෝත්පාදන බිහි කිරීමේ ක්‍රියාවලිය ව්‍යවසායකත්ව සංස්කෘතිය වේ.

(9) ව්‍යවසායකයෙකුට මූල්‍ය දිරිගැන්වීම් ලබා දෙන දේශීය වාණිජ බැංකුවක් වන්නේ,

1. ජාතික ඉතිරිකිරීමේ බැංකුව(NSB)
2. ප්‍රාදේශීය සංවර්ධන බැංකුව
3. මහජන බැංකුව
4. සමූපකාර ග්‍රාමීය බැංකුව

(10) තත්ත්ව පද්ධති සහතික කිරීම, ජාතික ප්‍රමිති සකස් කිරීම වැනි මූල්‍ය නොවන දිරිගැන්වීම් ලබා දෙනුයේ,

1. කාර්මික තාක්ෂණය ආයතනයයි.
2. අපනයන සංවර්ධන මණ්ඩලයයි.
3. ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයයි.
4. කාර්මික සංවර්ධන මණ්ඩලයයි.

පහත සඳහන් ප්‍රශ්න සඳහා කෙටි පිළිතුරු සපයන්න.

(11) දියුණු වීමට උත්සාහ දරමින් සිටින රටක් ලෙස ශ්‍රී ලංකාව මුහුණ දෙමින් සිටින ආර්ථික සමාජීය ගැටළු හතරක් දක්වන්න.

(12) ව්‍යවසායකත්ව සංස්කෘතියක් බිහි වීම සඳහා පැවතිය යුතු හිතකර සමාජීය හා ආර්ථික සාධක හතරක් දක්වන්න.

(13) ව්‍යවසායකත්වයට එරෙහි සමාජීය සාධක හතරක් නම් කරන්න.

(14) 'තොටිල්ල පදවන අත ලොව ආණ්ඩු කෙරේ' මෙම කියමනින් ගම්‍ය වන කාන්තාවන් සතු සුවිශේෂී හැකියාවන් හතරක් නම් කරන්න.

(15) ශ්‍රී ලංකා ආර්ථිකය තුළ කාන්තාවන්ට ව්‍යාපාර කිරීම සඳහා ඇති අවස්ථා දෙකක් උදාහරණ සමගින් දක්වන්න.

(16) ව්‍යාපාර සමාජ වගකීම ඉටු කළ හැකි ආකාර දෙකක් උදාහරණ සමගින් දක්වන්න.

(17) ව්‍යාපාර සමාජ වගකීම් ඉටු කිරීමෙන් අත්කරගත හැකි ප්‍රතිලාභ හතරක් නම් කරන්න.

(18) ව්‍යවසායකයන් දිරිගැන්වීමේ කටයුතු සඳහා රජය විසින් ලබා දෙන මූල්‍ය නොවන දිරිගැන්වීම් දෙකක් සහ එම දිරිගැන්වීම් ලබා දෙන ආයතන දෙකක් සඳහන් කරන්න.

වාණිජ හා ව්‍යාපාර අධ්‍යයන ශාඛාව